චක්‍රලේඛ අංකය: 5/2014

# අධ්‍යාපන අමාත්‍යාංශය
# අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග
## (2014 සිට ක්‍රියාත්මක වන පරිදි)

පිරිවෙන් අධ්‍යාපන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය - බත්තරමුල්ල.

# පටුන


| | | |
|---|---|---|
| (01) | අන්තර් පාර්වේණික භාෂා හා සාහිත්‍ය තරගාවලිය | 01 |
| (02) | තරග වර්ග හා අංශ | 02 |
| (03) | කථික තරග | 03 |
| (04) | ආගමික කටයුතු කුසලතා තරගය | 04 |
| (05) | දේශන කුසලතා තරගය | 05 |
| (06) | ගායන කුසලතා තරගය | 06 |
| (07) | ගද්‍ය රචනා තරග | 07 |
| (08) | අත් අකුරු තරගය | 08 |
| (09) | දෙමළ අත් අකුරු තරගය | 09 |
| (10) | බෞද්ධ චිත්‍ර තරගය | 10 |
| (11) | සිංහල පද්‍ය රචනා තරගය | 11 |
| (12) | පාලි ගාථා රචනා තරගය | 12 |
| (13) | සංස්කෘත ශ්ලෝක රචනා තරගය | 13 |
| (14) | භාෂා හා සාහිත්‍යඥාන තරගය | 14 |
| (15) | ත්‍රිපිටක ධර්මඥාන තරගය | 15 |
| (16) | හසුරු කුසලතා තරගය | 16 |
| (17) | ගණිතඥාන තරගය | 17 |
| (18) | ධර්ම දේශනා තරගය | 18 |
| (19) | තරග පැවැත්වීම සඳහා උපදෙස් | 19 |
| (20) | ආදර්ශ අයදුම් පත්‍රය | 21 |


## ආදර්ශ අයදුම් පත්‍රය

## අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග 20.........

01. පිරිවෙනේ නම : .................................................................................

02. පිරිවෙනේ ලිපිනය :...........................................................................

03. අයදුම්කරුගේ නම :...........................................................................

04. ඉදරිපත්වන තරග අංශය :.................................................................

05. ඉගෙනුම ලබන වසර /ශ්‍රේණිය :.....................................................

06. ඉදිරිපත්වන තරග ඉසව්ව:.................................................................

........................................................................................... පිරිවෙනේ

.................. වසරේ/ශ්‍රේණියේ ඉගෙනුම ලබන .......................................

..................................................... ශිෂ්‍යයා ..............................................

අංශයේ ............................................................................................ තරගය

සඳහා ඉදිරිපත් කරන බවත් තරගය සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය:

පරිවෙණාධිපතින් වහන්සේගේ
අත්සන හා නිල මුද්‍රාව

ඉහත තරගය සඳහා මා ඉදිරිපත් වන බවත්, තරග නීති රීතිවලට එකඟවන බවත් සහතික වෙමි.

දිනය:

තරගකරුගේ අත්සන

## (16) ධර්මදේශනා තරගයඃ

මෙම තරගය අංශ හතර සඳහා ම පැවැත් වේ. විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන ධර්ම දේශනාවක් පුරාණ සම්ප්‍රදායානුකූල ලෙස විධිමත්ව ඉදිරිපත් කළ යුතුය.

16 - 1 අභිමතාර්ථ

I. ධර්මදේශනා පැවැත්වීමේ කුසලතාව වර්ධනය කර ගැනීමට හා සාම්ප්‍රදායික ක්‍රමවේදයන් ඉගෙනීමට පෙළඹවීම.

II. තමන්ට ආවේනික වූ දේශනා විලාසයක් ගොඩනගාගෙන විචිත්‍ර ධර්ම දේශකයන් වහන්සේ නමක් වීමට උනන්දු කරවීම.

16- 2 තරග කොන්දේසි

01. විනිශ්චය මණ්ඩලය මගින් එම මොහොතේ ම ලබාදෙන තේමාවක් යටතේ ධර්ම දේශනය පැවැත්විය යුතුය.

02. එක් තරගකරුවෙකුට ලැබෙන කාලය විනාඩි 07 කි.

03. වටාපතක් නියමිත පරිදි අල්වාගෙන ධර්ම දේශනය පැවැත්වීමට තරග කරුවන්ට සිදු වේ.

- i. පැන්වැඩීමේ අනුශාසනාවක්
- ii. මතක ධර්ම දේශනයක්
- iii. පාංශුකූල දේශනයක්
- iv. බුද්ධ පූජාව පැවැත්වීමෙන් පසු කෙරෙන අනුශාසනාවක්
- v. භක්තානුමෝදනාවක් (දානය වැළදීමට පෙර කෙරෙන අනුශාසනාව)
- vi. භුක්තානුමෝදනාවක් (දානය වැළදීමට පසු කෙරෙන අනුශාසනාව)
- vii. පිරිත් අනුශාසනාවක්

16- 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| i. | දේශනා විලාසය | - | 10 |
| ii. | කරුණුවල සාරවත් බව | - | 10 |
| iii. | සම්ප්‍රදායානුකූල බව | - | 10 |
| iv. | වටාපත නිවැරදිව අල්ලා ගැනීම | - | 10 |
| v. | සමස්තය | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |



## (01) කථික තරගඃ

මෙම තරගය සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා පහෙන් ම පැවැත් වේ. එක් තරගකරුවෙකුට එක් භාෂා මාධ්‍යයකින් පමණක් සහභාගී විය හැකිය. පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අංශ දෙක සඳහා සිංහල, දෙමළ භාෂා දෙකින් පමණක් තරග පැවැත් වේ.

01 - 1 අභිමතාර්ථ

I. වාග් චාතුර්යය, තර්කනය හා මාතෘකාවට අදාළව, ක්‍රමානුකූලව කරුණු පැහැදිලි කිරීමේ හැකියාව ඇති කිරීම සහ විවිධ ක්ෂේත්‍ර යටතේ දැනුම රැස් කිරීමේ රුචිය වර්ධනය කිරීම.

II. හඬ පාලනය හා උචිත අංග චලන භාවිත කිරීමේ කුසලතාව ඇති කිරීම.

01- 2 තරග කොන්දේසි

01. පැහැදිලි නිරවද්‍ය උච්චාරණය, අවස්ථාවෝචිත අංග චලනය හා හඬ පාලනය ගැන අවධානය යොමු කළ යුතුය.

02. සෑම තරගකරුවෙකුට ම විනාඩි 05 ක පෙර සූදානමකට අවස්ථාව හිමිවෙන අතර කථාව ද විනාඩි 05 කට සීමා විය යුතුය.

03. දෙනු ලබන මාතෘකා දෙකෙකින් එකක් යටතේ කථාව කළ යුතුය.

04. ජාතික මට්ටම දක්වා පහත තේමා යටතේ මාතෘකා සැකසේ.

| | | | |
|---|---|---|---|
| i. | භික්ෂු අධ්‍යාපනය | vii. | ජාතික වීරවරු |
| ii. | ලංකා ඉතිහාසය | viii. | පැරණි උරුමයන් |
| iii. | මුද්‍රිත හා විද්‍යුත් ජනමාධ්‍ය | ix. | ගෝලීයකරණය |
| iv. | පරිසරය | x. | බෞද්ධ සාහිත්‍යය |
| v. | විද්‍යාව හා තාක්ෂණය | xi. | සාහිත්‍යධරයන් |
| vi. | ශාසන ඉතිහාසය | | |

05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

01 - 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| i. | මාතෘකාවට අදාළ කරුණු | - | 10 |
| ii. | පැහැදිලි නිවැරදි උච්චාරණය හා හැඟීම් ප්‍රකාශනය | - | 10 |
| iii. | තර්කානුකූල බව | - | 05 |
| iv. | කරුණු තහවුරු කිරීම සඳහා අවස්ථාවෝචිතව සිදුවන අංගචලනය | - | 05 |
| v. | කථා සන්දර්භයට අදාළ සිත්ගන්නා සුළු ඉදිරිපත් කිරීම | - | 10 |
| vi. | නියමිත කාලයට සීමා කිරීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | |

# තරග වර්ග හා අංශ

| | තරග වර්ගය | පූර්ව ප්‍රාථමික | ප්‍රාථමික | කනිෂ්ඨ | ජ්‍යෙෂ්ඨ | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| | අදාළවන ශ්‍රේණිය | 1,2,3 විද්‍යායතන 6,7,8 | 4,5 විද්‍යායතන 9,10,11 | ප්‍රාචීන ප්‍රාරම්භ උසස්පෙළ | උපාධි ප්‍රාචීන මධ්‍යම අවසාන ප්‍රථම ශාස්ත්‍ර | |
| 01 | සිංහල කථික | x | x | x | x | 04 |
| 02 | පාලි කථික | - | - | x | x | 02 |
| 03 | සංස්කෘත කථික | - | - | x | x | 02 |
| 04 | දෙමළ කථික | x | x | - | - | 02 |
| 05 | ඉංග්‍රීසි කථික | - | - | x | x | 02 |
| 06 | ආගමික කටයුතු කුසලතා | x | x | x | x | 04 |
| 07 | දේශන කුසලතා | x | x | x | x | 04 |
| 08 | ගායන කුසලතා | x | x | x | x | 04 |
| 09 | සිංහල ගද්‍ය රචනා | x | x | x | x | 04 |
| 10 | පාලි ගද්‍ය රචනා | - | - | x | x | 02 |
| 11 | සංස්කෘත ගද්‍ය රචනා | - | - | x | x | 02 |
| 12 | දෙමළ ගද්‍ය රචනා | - | x | x | - | 02 |
| 13 | ඉංග්‍රීසි ගද්‍ය රචනා | - | - | x | x | 02 |
| 14 | අත් අකුරු | x | x | x | x | 04 |
| 15 | දෙමළ අත් අකුරු | x | x | x | x | 04 |
| 16 | බෞද්ධ චිත්‍ර | x | x | x | x | 04 |
| 17 | සිංහල පද්‍ය රචනා | - | - | x | x | 02 |
| 18 | පාලි ගාථා රචනා | - | - | - | x | 01 |
| 19 | සංස්කෘත ශ්ලෝක රචනා | - | - | - | x | 01 |
| 20 | සිංහල භාෂා හා සාහිත්‍යඥාන | - | - | x | x | 02 |
| 21 | පාලි භාෂා හා සාහිත්‍යඥාන | - | - | x | x | 02 |
| 22 | සංස්කෘත භාෂා හා සාහිත්‍යඥාන | - | - | x | x | 02 |
| 23 | ත්‍රිපිටක ධර්මඥාන | - | - | x | x | 02 |
| 24 | හසුරු කුසලතා | x | x | x | x | 04 |
| 25 | ගණිතඥාන | x | x | - | - | 02 |
| 26 | ධර්ම දේශනා | x | x | x | x | 04 |
| **සමස්ත එකතුව** | | 12 | 13 | 22 | 23 | 70 |



# තරග පැවැත්වීම සඳහා උපදෙස්

මෙම තරග මාලාව පාරිවෙණික, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් තරග වට තුනකින් සමන්විත වේ. එක් තරගකරුවෙකුට සහභාගි විය හැකි උපරිම තරග සංඛ්‍යාව දෙකකි. ඒ ලිඛිත එකක් හා වාචික එකක් වශයෙනි. තරග කොන්දේසි හා නීති රීති පාරිවේණික තරග ආරම්භයට පෙර ශිෂ්‍යයන්ට අවබෝධ කරදිය යුතුය.

තරගකරුවන් සියලු ම දෙනා ආයතනයේ ශිෂ්‍යභාවය ලබා අවම වශයෙන් මාස දෙකක්වත් ගතවී තිබිය යුතුය. පළමු වාරයේ අවසන් දිනය වන විට පාරිවේණික තරග පවත්වා එක් ශිෂ්‍යයෙකුට එක් අයදුම්පත්‍රය බැගින් පුරවා බාර දී තිබිය යුතුය. නියමිත දිනට පෙර ඉල්ලුම්පත්‍ර නොඑවන ශිෂ්‍යයන්ට තරගය සඳහා සහභාගිවීමේ අවස්ථාව අහිමි වේ. පරිවෙණාධිපතීන් වහන්සේ විසින් අත්සන හා නිල මුද්‍රාව තබා ශිෂ්‍යාගේ අනන්‍යතාව තහවුරු කළ යුතුය.

- ## පාරිවේණික තරග වටය (මාර්තු 25 වන දිනට පෙර)

මෙම තරග වටය පිරිවෙනේ ශිෂ්‍යයින් අතර පැවැත් වේ. මාර්තු 25 දිනය වනවිට පාරිවෙණික තරග පවත්වා අවසන් කළ යුතුය. ප්‍රථම වාරයේ නිවාඩු ලබාදීමට පෙර අදාළ තරග සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගේ නාම ලේඛනය ප්‍රදේශය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේ හෝ මහතා වෙත භාරදිය යුතුය. එහි වගකීම ගරු පරිවෙණාධිපතීන් වහන්සේ සතුය. පාරිවේණික තරග වටය පරිවෙණාධිපති හිමියන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

- ## දිස්ත්‍රික් තරග වටය (ජුලි 20 වන දිනට පෙර)

මෙම තරග වටය පාරිවෙණික තරගවටයෙන් ජයගන්නා ශිෂ්‍යයින් අතර පැවැත් වේ. දිස්ත්‍රික්කයේ සියලු ම පිරිවෙන්වල ජයග්‍රාහී ශිෂ්‍යයන් එක් තැනකට ගෙන්වා දිස්ත්‍රික් මට්ටමින් තරග පැවැත් වේ. ප්‍රශ්න පත්‍ර උපදෙස් පත්‍රිකා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව මගින් ලබාදේ. මාසයේ එකම දිනයක දී සමස්ත ලංකාව පුරාම තරගය පැවැත් විය යුතුය.

ප්‍රදේශය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේ හෝ මහතාගේ අධීක්ෂණයෙන් කෘත්‍යාධිකාරි/පරිවෙණාධිපති සංගමය මගින් තරගය සංවිධානය කළ යුතුය. තරග පවත්වා දින 05 ක් ඇතුළත ප්‍රදේශය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේ හෝ මහතා විසින් ප්‍රථමස්ථානය හිමිකර ගත් ශිෂ්‍යයන්ගේ නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් තරග සංවිධායක නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත භාරදිය යුතුය.

- ## සමස්ත ලංකා තරග වටය (ඔක්තෝබර් 20 වන දිනට පෙර)

දිස්ත්‍රික් තරග වටයෙන් ප්‍රථමස්ථානය හිමි කර ගන්නා ශිෂ්‍යයින් සඳහා සමස්ත ලංකා තරග වටය පැවැත් වේ. ඔක්තෝබර් මාසය තුළදී පැවැත්වෙන මෙම තරගය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) මග පෙන්වීම යටතේ තරග සංවිධායක නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ගේ අධීක්ෂණය හා සංවිධානය යටතේ පැවැත් වේ.

## (02) ආගමික කටයුතු කුසලතා තරගය:

මෙම තරගය පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ යන අංශ හතර සඳහා ම පැවැත් වේ. විනිශ්චය මණ්ඩලය මගින් ඉදිරිපත් කරනු ලබන ආගමික කටයුත්තක් සම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කළ යුතුය.

02 - 1 <u>අභිමතාර්ථ</u>

I. ශාසනික අවශ්‍යතා ශ්‍රාවක ප්‍රසාදය වැඩිවන අයුරින් නිවැරදිව හා අවබෝධයෙන් ඉටුකිරීමට අවශ්‍ය ශාසනික ව්‍යවහාර කුසලතාව දියුණු කිරීම.

II. පටිපාටිගත පිළිවෙළ හා සම්ප්‍රදායය උල්ලංඝනය නොකොට ශාසන ගෞරවයෙන් ආගමික කටයුතු කිරීමේ හා කරවීමේ හැකියාව දියුණු කිරීම.

02- 2 <u>තරග කොන්දේසි</u>

01. එම අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන ඉදිරිපත් කිරීමක් කළ යුතුය.
02. එක් තරගකරුවෙකු සඳහා විනාඩි 07 ක කාලයක් හිමි වේ.
03. පටිපාටිගත පිළිවෙල හා සම්ප්‍රදායය අනුව අදාළ ඉදිරිපත් කිරීම කළ යුතුය.
04. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
05. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ අදාළ ඉදිරිපත් කිරීම් කිරීමට තරග කරුවන්ට සිදු වේ.

    i. තිසරණ පන්සිල් හි පිහිටුවීම
    ii. අෂ්ටාංග උපෝසථ ශීලයෙහි පිහිටුවීම
    iii. වන්දනා ගාථා නිවැරදිව හා පිළිවෙළට කියවීම
    iv. බුද්ධ පූජාව පැවැත්වීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ)
    v. බුද්ධ වන්දනා කරවීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ)
    vi. පිං වාක්‍ය කියවීම
    vii. දානය, ගිලන්පස හා මතක වස්ත්‍ර, සංඝික කිරීම
    viii. පිරිතට ආරාධනා කිරීමේ ගාථාව කියවීම

02- 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | පටිපාටිගත පිළිවෙළ නොබිඳීම | - | 10 |
| ii. | පැරණි සම්ප්‍රදායය සුරැකීම | - | 10 |
| iii. | අක්ෂර හා වචන උච්චාරණය | - | 10 |
| iv. | ශ්‍රවන මාධූර්යය | - | 10 |
| v. | ශ්‍රමන සාරූප්‍යතාවෙන් ඉදිරිපත් කිරීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |



## (15) ගණිතඥාන තරගය:

මෙම තරගය පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ.

ගණිතඥාන මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීමට තරග කරුවන්ට සිදු වේ.

15 - 1 <u>අභිමතාර්ථ</u>

I. ගණිතමය ඥානය ලබා ගැනීම සහ බුද්ධිවර්ධනය.

II. තර්කන හැකියාව තුළින් ජීවන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මග පෙන්වීම.

15- 2 <u>තරග කොන්දේසි</u>

01. මෙය ලිඛිත ප්‍රශ්න පත්‍රයකි.
02. එක් තරගකරුවෙකුට ලැබෙන කාලය පැය 02 කි.
03. ගණිතමය සොයා ගැනීම් සිදුකළ ගණිතඥයින් පිළිබඳ ප්‍රශ්න අසනු ලැබේ.
04. ගණිතමය ඥානය, අභියෝගතා ඥානය, විෂයානුබද්ධ දැනුම පිළිබඳ පරීක්ෂා කෙරේ.
05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තිරණය වේ.

15- 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු ප්‍රමාණය 100 කි.

ප්‍රශ්න පත්‍ර හා උපදෙස් පත්‍රිකා පිරිවෙන් ශාඛාව මගින් සැපයේ. අත් අකුරු හා බෞද්ධ චිත්‍ර තරග සඳහා අවශ්‍ය කඩදාසි සැපයේ. පාට හෝ වෙනත් අවශ්‍ය දෑ තරගකරුවන් විසින් රැගෙන ආ යුතුය.

- ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමීම

පාරිවේණික තරග ජයග්‍රාහකයින් සඳහා වර්ෂාවසානයේ පිරිවෙනේ පවත්වනු ලබන ත්‍යාග ප්‍රදානෝත්සවයක දී ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමිය යුතුය.

දිස්ත්‍රික් තරග සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික හා ත්‍යාග පිරිනැමීම ට අවශ්‍ය පොත් කට්ටල ලබාදෙනු ඇත. දිත්‍රික්ක මට්ටමින් පවත්වනු ලබන උත්සවයක දී ත්‍යාග සහතික පත්‍ර පිරිනැමේ.

සමස්ත ලංකා ත්‍යාග අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ත්‍යාග ප්‍රදානෝත්සවයක දී පිරිනැමේ.



# අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගාවලිය

ශ්‍රී ලංකාවේ ඉපැරණි සම්භාව්‍ය අධ්‍යාපන ආයතනය පිරිවෙන යි. මිෂනාරි අධ්‍යාපන ක්‍රමය මෙරටට පැමිණීමට ප්‍රථම මෙරට පැවැති අධ්‍යාපනය පන්සල හා පිරිවෙන කේන්ද්‍රකොට ගෙන පැවතුණි. පිරිවෙන් අධ්‍යාපනය තුළින් සිංහල, පාලි, සංස්කෘත ආදී ප්‍රාචීන භාෂාවන් මෙන්ම ගණිත, ඉංග්‍රීසි වැනි ප්‍රතිචීන භාෂාවන් ඉගැන්වීම ද සිදු කෙරේ.

අධ්‍යාපනය යනු දැනුම ආකල්ප කුසලතා පිරිපුන් පූර්ණ පෞරුෂ වර්ධයනයක් සහිත පුද්ගලයෙකු බිහි කිරීමයි. ඒ සඳහා පන්ති කාමර අධ්‍යාපනය පමණක් ප්‍රමාණවත් නොවේ. විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයින් යොමු කිරීම ද අත්‍යවශ්‍ය වූවකි.

පිරිවෙන් අධ්‍යාපනය ලබන පැවිදි ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා හා ගිහි ශිෂ්‍ය දරුවන්ට ඒකාකාරී අධ්‍යාපන රටාවෙන් මිදී විවිධත්වයකින් ඉගෙනීමට අවස්ථාව සලසා දීම කාලීන අවශ්‍යතාවකි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව මගින් ක්‍රියාත්මක කෙරෙන අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගාවලිය පූර්වෝක්ත අරමුණු ඉටු කර ගැනීමට ශිෂ්‍යයින්ට ලැබෙන මහගු අවස්ථාවකි. ඒ තුළින් භාෂා කුසලතා නිර්මාණ කුසලතා, කථික කුසලතා, හසුරු කුසලතා මෙන්ම ධර්ම දේශනා කුසලතා වර්ධනය කර ගැනීමට මහගු පිටිවහලක් ලැබේ.

එකී කුසලතාවන් මැන බැලීම සඳහා පාරිවේණික දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් වට තුනකින් සමන්විත තරග මාලාවක් සංවිධානය කර තිබේ. මෙහි වටිනාකම දූරදර්ශිව තේරුම්ගෙන තමන් වෙත පැවරී ඇති වගකීම් කොටස පූර්ණ කැපවීමෙන් යුතුව ඉටු කරන ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්), නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේලා, පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරි ස්වාමීන් වහන්සේලා, විෂය උපදේශකවරුන්, ගුරු උපදේශකවරුන්, ගරු කෘත්‍යාධිකාරි /පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා පැවිදි ගිහි පරිවේණාචාර්යවරුන් වෙත කාරුණිකව අවධාරණය කරමි.

2014 පෙබරවාරි මස 10 දින
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## (14) හසුරු කුසලතා තරගය:

මෙම තරගය අංශ හතරම සඳහා පැවැත් වේ. විනිශ්චය මණ්ඩලය ඉදිරියේ තමන් කැමති ඕනෑම නිර්මාණයක් කර දක්වීමට තරගකරුවන්ට අවස්ථාව ලැබේ.

14 - 1 <u>අභිමතාර්ථ</u>

I. ශිෂ්‍යයින් තුළ සැඟවී ඇති සහජ හැකියා හඳුනාගෙන ඒවා වැඩි දියුණු කර ගැනීමට පෙළඹවීම.

II. නව නිර්මාණ කිරීමට හා විෂය බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කිරීම.

14 - 2 <u>තරග කොන්දේසි</u>

01. තමන් සුදානම් වී පැමිණි ඕනෑම නිර්මාණයක් විනිශ්චය මණ්ඩලය ඉදිරියේ සකසා පෙන්විය යුතුය.
02. ස්වකීය නිරාමාණය කිරීම සඳහා පැය 2 ක කාලයක් හිමි වේ.
03. නිර්මාණයට අවශ්‍ය සියලු ම අමුද්‍රව්‍ය හා උපකරණ තරගකරුවන් විසින් රැගෙන ආ යුතුය.
04. පහත සඳහන් තේමා යටතේ ස්වකීය නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
    i. මල් හා වෙනත් දෑ නිර්මාණය
    ii. ඉදල් කොහු බැඳීම
    iii. සිවුරු කැපීම
    iv. කැටයම් හා මූර්ති නිර්මාණය
    v. දුවිලි හා පා පිස්නා සැකසීම
    vi. විදුලි බලයෙන් කෙරෙන නිර්මාණ
    vii. විද්‍යාත්මක නිර්මාණ

14 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | නිර්මාණයේ නව තාවය | - | 10 |
| ii. | අමුද්‍රව්‍ය භාවිතය | - | 05 |
| iii. | නිර්මාණ ශක්තිය | - | 15 |
| iv. | නිමාව | - | 10 |
| v. | සමස්තය | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |



## (03) දේශන කුසලතා තරගය:

මෙම තරගය අංශ හතර සඳහා ම පැවැත් වේ. පාරම්පරික දේශන සම්ප්‍රදායයන්ට අයත් විවිධ දේශනාවන් පිළිබඳ විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන දේශනාවක් පෞරාණික දේශන විලාසයට අනුව ඉදිරිපත් කළ යුතුය.

03 - 1 <u>අභිමතාර්ථ</u>

I. ලාංකික භික්ෂූන් වහන්සේලා පරපුරින් පරපුරට පවත්වාගෙන ආ දේශනා සම්ප්‍රදායයන් අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා උනන්දු කරවීම.

II. සම්ප්‍රදායය ආරක්‍ෂා කරමින් ශාසන ගෞරවය සුරක්‍ෂිත වන පරිදි දේශනා ක්‍රම ඉදිරිපත් කිරීමට පෙළඹවීම.

03 - 2 <u>තරග කොන්දේසි</u>

01. එම අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන දේශනාවක් හෝ කිහිපයක් දේශනා කර පෙන්විය යුතුය.
02. එක් තරගකරුවෙකු සඳහා විනාඩි 07 ක කාලයක් හිමි වේ.
03. සම්ප්‍රදායානුකූල දේශනා විලාසයන් නොබිඳ ඉදිරිපත් කිරීම කළ යුතුය.
04. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
05. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ දේශනාවක් ඉදිරිපත් කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| i. නමස්කාර ගාථා | | ii. දේවතාරාධනා | |
| iii. ජාතක දේශනා | | iv. විහාර අස්න | |
| v. දොරකඩ අස්න අනුශාසනාව | | vi. පරිත්‍රාන දේශනාවේ විවිධ ක්‍රම | |

(පිරිත් පිරීම, පොත පිරීම, බොජ්ඣංග ගාථා, සූත්‍ර දේශනා, ආටානාටිය සූත්‍රය හා ඒ ඒ අවස්ථාවලට අදාළ නමස්කාර ක්‍රම)

03 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | සම්ප්‍රදායානුකූල බව | - | 10 |
| ii. | නිවැරදි අක්ෂර හා වචන උච්චාරණය | - | 10 |
| iii. | ශ්‍රවන මාධූර්යය | - | 10 |
| iv. | හඬ පාලනය | - | 10 |
| v. | ශාසන ගෞරවයෙන් ඉදිරිපත් කිරීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |

## (04) ගායන කුසලතා තරගය:

මෙම තරගය පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. තමන් කැමති වෘත්තයකට අනුව ගායනය ඉදිරිපත් කළ හැකිය.

04 - 1 අභිමතාර්ථ

I. සම්ප්‍රදායානුකූලව වෘත්ත හඳුනාගෙන හුදීජන ප්‍රසාදය සඳහා තම කුසලතාව ඔප්නංවා ගැනීමට පෙළඹවීම.

II. ස්මරණ ශක්තියෙන් ශ්‍රවන මාධුර්යය රැකෙන පරිදි මධුර ස්වරයෙන් ඉදිරිපත් කිරීමට හා විවිධ වෘත්ත හඳුනා ගැනීමට යොමු කිරීම.

04 - 2 තරග කොන්දේසි

01. සිංහල කවියක් පාලි ගාථාවක් හා සංස්කෘත ශෙලෝකයක් ඉදිරිපත් කිරීමට තරග කරුවන්ට සිදු වේ.

02. තමන් පුරුදු පුහුණු වී පැමිණි සිංහල කවියක් පාලි ගාථාවක් හා සංස්කෘත ශෙලෝකයක් ඉදිරිපත් කළ යුතුය.

03. ඉදිරිපත් කිරීම කටපාඩමින් පමණක් කළ යුතුය.

04. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

05. ජාතික මට්ටම දක්වා ම සිංහල කවියක් පාලි ගාථාවක් හා සංස්කෘත ශෙලෝකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

04 - 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| i. | සම්ප්‍රදායානුකූල බව | - | 10 |
| ii. | නිවැරදි උච්චාරණය | - | 10 |
| iii. | ශ්‍රවන මාධුර්යය | - | 10 |
| iv. | හැගීම් දනවීම | - | 10 |
| v. | ස්මරණ ශක්තිය | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |



## (13) ත්‍රිපිටක ධර්මඥාන තරගය:

මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. ත්‍රිපිටකධර්මඥානය මැන බැලීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීමට තරග කරුවන්ට සිදු වේ.

13 - 1 අභිමතාර්ථ

I. සූත්‍ර, විනය, අභිධර්මය යන ත්‍රිපිටකය හා බුද්ධ චරිතය මෙන්ම ශ්‍රාවක ශ්‍රාවිකා චරිත පිළිබඳවත්, ශාසන ඉතිහාසය හා බෞද්ධ දර්ශනය පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමට පෙළඹවීම.

II. බුද්ධාගම තමන්ට අවබෝධ කර ගැනීමටත් අන්‍යයන්ට අවබෝධ කරවීමටත් අවශ්‍ය ප්‍රමාණවත් ධර්මඥානයක් ලබා ගැනීමට යොමු කිරීම.

13 - 2 තරග කොන්දේසි

01. පිළිතුරු ලිවීම සඳහා ලැබෙන කාලය පැය තුනකි.

02. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

03. පහත අංශ යටතේ ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

i. සූත්‍ර, විනය, අභිධර්මය

ii. බුද්ධ චරිතය

iii. ශ්‍රාවක ශ්‍රාවිකා චරිත

iv. ශාසන ඉතිහාසය

v. බෞද්ධ දර්ශනය

13 - 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු ප්‍රමාණය 100 කි.

## (12) භාෂා හා සාහිත්‍යඥාන තරගය:

මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. සිංහල, පාලි, සංස්කෘත යන භාෂා තුන සඳහා තරග ඉසව් තුනක් පැවැත් වේ. එක් තරගකරුවෙකුට එක් තරග ඉසව්වක් සඳහා පමණක් සහභාගි විය හැකිය.

- ✓ සිංහල භාෂා හා සාහිත්‍යඥාන තරගය
- ✓ පාලි භාෂා හා සාහිත්‍යඥාන තරගය
- ✓ සංස්කෘත භාෂා හා සාහිත්‍යඥාන තරගය

12 - 1 <u>අභිමතාර්ථ</u>

I. භාෂාවේ සම්මත ව්‍යාකරණ විධි හා භාෂාඥානය වැඩි දියුණු කර ගැනීමටත් භාෂාවේ සාම්ප්‍රදායික යෙදුම් හා භාවිත හැකියා වර්ධනය කර ගැනීමටත් පෙළඹවීම.

II. සාහිත්‍යඥානය හා පෙරදිග විචාර මූලධර්ම මෙන් ම සාහිත්‍ය විචාරය පිළිබඳවත් අවබෝධයක් ලබාදීම.

12 - 2 <u>තරග කොන්දේසි</u>

01. මෙය ලිඛිත පරීක්ෂණයකි.
02. භාෂා තුනෙන් ප්‍රශ්න පත්‍ර තුනක් සැකසේ.
03. එක් තරගකරුවෙකුට එක් භාෂා මාධ්‍යකින් පමණක් තරගයට සහභාගී විය හැකිය.
04. ව්‍යාකරණ හා සාහිත්‍ය යන කොටස් දෙකකින් යුක්තව ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.
05. ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීම සඳහා ලැබෙන කාලය පැය 03 කි.
06. සිංහල, පාලි, සංස්කෘත යන භාෂා තුනෙහි අක්ෂර සංඥා, සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත, ආඛ්‍යාත, නාම වරනැගීම හා පරිවර්තනය මෙන්ම සාහිත්‍යඥානය ද ඇතුළත් කොට ප්‍රශ්න පත්‍රය සැකසේ.
07. ප්‍රාචීන ප්‍රාරම්භ, අ.පො.ස.(උ.පෙළ) විෂය නිර්දේශ අනුව කනිෂ්ඨ ශිෂ්‍යයන්ටත්, ප්‍රාචීන මධ්‍යම අවසාන හා විශ්වවිද්‍යාල පාඨමාලා විෂය නිර්දේශය අනුව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන්ටත් ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ.
08. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

එක් ප්‍රශ්න පත්‍රයක් කොටස් දෙකකින් යුක්තවන අතර, කොටස් දෙකින් ම තෝරාගත් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට තරගකරුවන්ට සිදු වේ. ලබාදෙන ලකුණු ප්‍රමාණය 100 කි.



## (05) ගද්‍ය රචනා තරග:

සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා පහෙන් ම මෙම තරගය පැවැත් වේ. සිංහල ගද්‍ය රචනා තරගය පමණක් අංශ හතර සඳහාම පැවැත්වෙන අතර, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි ගද්‍ය රචනා තරග කනිෂ්ඨ , ජ්‍යෙෂ්ඨ අංශ දෙක සඳහා ද දෙමළ ගද්‍ය රචනා තරගය ප්‍රාථමික හා කනිෂ්ඨ අංශ දෙක සඳහා ද පමණක් පැවැත් වේ. එක් තරගකරුවෙකුට එක් භාෂා මාධ්‍යයකින් පමණක් තරගයට සහභාගී විය හැකිය.

05 - 1 <u>අභිමතාර්ථ</u>

I. මාතෘකාවට අදාළව ව්‍යාකරණානුකූල ලෙස සංගත බවෙන් යුක්තව අදහස් පෙළ ගැස්වීමේ හැකියාව වර්ධනය කිරීම.

II. ලේඛන කුසලතාව වර්ධනය කිරීම සහ විවිධ රචනා ශෛලීන් හැඳිනගෙන ඒවා භාවිතයෙහි යෙදවීමට පෙළඹවීම.

05 - 2 <u>තරග කොන්දේසි</u>

01. පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික තරගකරුවන් දෙනු ලබන මාතෘකාවකට අනුව වචන 150 කට නොඅඩු වාක්‍ය රචනාවක් ද කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශයේ තරගකරුවන් වචන 250 කට නොඅඩු වාක්‍ය රචනාවක් ද කළ යුතුය.
02. අදාළ භාෂාවෙන් ම රචනය ලිවිය යුතු අතර සංස්කෘත තරගකරුවන් නාගරී අකුරු භාවිත කළ යුතුය. දෙමළ තරගකරුවන් දෙමළ අකුරු භාවිත කළ යුතුය.
03. සියලු ම තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01 කි.
04. පැහැදිලි අත්අකුරු, අක්ෂර වින්‍යාසය, ඡේද වෙන් කර ලිවීම, මාතෘකාවට අදාළ බව කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතුය.
05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
06. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ මාතෘකා සැකසේ.

| | | | |
|---|---|---|---|
| i. | පිරිවෙන් අධ්‍යාපනය | viii. | ජාතික සමගිය |
| ii. | සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍ය | ix. | ඉගෙනීම |
| iii. | දෙස බස රැසට සේවය කළ විරුවන් | x. | ජාතික උරුමයන් |
| iv. | ශ්‍රී ලංකාවේ ස්වභාව සෞන්දර්යය | xi. | ආගමික උත්සව |
| v. | සිංහල, පාලි, සංස්කෘත පඬිවරු | xii. | ශාසනික පුනරුදය |
| vi. | ජනමාධ්‍ය අංශය | xiii. | පොතපත කියවීම |
| vii. | ජාතික හා ආගමික උත්සව | xiv. | නූතන තාක්ෂණික අධ්‍යාපනික මෙවලම් |

05 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | සාරවත් කරුණු | - | 10 |
| ii. | භාෂා රීතීන් අනුගමනය | - | 10 |
| iii. | ශිල්පීයදක්ෂතා (පද බෙදීම/ඡේද වෙන් කිරීම/ විරාම ලක්ෂණ/අත්අකුරු) | - | 10 |
| iv. | රචනා ශෛලිය | - | 10 |
| v. | මාතෘකාවට අදාළ බව | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |

## (06) අත් අකුරු තරගය:

මෙම තරගය අංශ හතරම සඳහා පැවැත් වේ. සිංහල, සංස්කෘත හා ඉංග්‍රීසි භාෂා තුනෙන් ඡේද තුනක් ලිවීමට තරගකරුවන්ට සිදු වේ.

06 - 1 <u>අභිමතාර්ථ</u>

I. සිංහල, සංස්කෘත හා ඉංග්‍රීසි අක්ෂර පිරිපුන් බවෙන් හා සම්මත හැඩයෙන් යුක්තව ලිවීම සඳහා පෙළඹවීම.

II. නිවැරදි විරාම ලක්ෂණ යෙදීම, සම්ප්‍රදායානුකූලව පද බෙදීම, අක්ෂර වින්‍යාසය ආදී ලේඛන සම්ප්‍රදායයන් ඉගෙනීමට යොමු කිරීම.

06 - 2 <u>තරග කොන්දේසි</u>

01. අත් අකුරු තරගය සඳහා ඉදිරිපත්වන තරගකරුවන් සිංහල, සංස්කෘත හා ඉංග්‍රීසි ඡේද තුනක් ලියා පෙන්විය යුතුය.

02. අත් අකුරු තරගය සඳහා පැය 01 කාලයක් හිමි වේ.

03. විරාම ලක්ෂණ, පද බෙදීම හා අක්ෂර වින්‍යාසය ගැන සැලකිලිමත් විය යුතුය.

04. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

06 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | අකුරුවල පිරිපුන් බව හා හැඩය | - | 10 |
| ii. | නිවැරදි අක්ෂර වින්‍යාසය | - | 10 |
| iii. | විරාම ලක්ෂණ නිවැරදිව යෙදීම | - | 10 |
| iv. | පද වෙන්කර ලිවීම | - | 10 |
| v. | පැහැදිළි හා පිරිසිදුව ලිවීම | - | 10 |
| | මුළු ලකුණු | - | 50 |



## (11) සංස්කෘත ශ්ලෝක රචනා තරගය:

මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. දෙනු ලබන මාතෘකාවකට අනුව තමන් කැමති වෘත්තයකින් එම මෙහොතේදී ම පද්‍ය නිර්මාණය කිරීමට තරගකරුවන්ට සිදු වේ.

11 - 1 <u>අභිමතාර්ථ</u>

I. සංස්කෘත භාෂා නිපුණතාව ලබා ගන්නා අතරම ශ්ලෝක රචනය සඳහා නැඹුරු කිරීම.

II. ශ්ලෝක රචනයට අවශ්‍ය ශාස්ත්‍රීය මූලධර්ම ඉගෙනීමට හා විවිධ වෘත්ත හඳුනා ගැනීමට පෙළඹවීම.

11 - 2 <u>තරග කොන්දේසි</u>

01. තරගකරුවන් කැමති වෘත්තයකින් හෝ වෘත්ත කිහිපයකින් ශ්ලෝක 06 ක් රචනා කළ යුතුය.

02. එම මොහොතේ ලබාදෙන මාතෘකාවන්ගෙන් තෝරාගත් මාතෘකාවක් අනුව ශ්ලෝක නිර්මාණය කළ යුතුය.

03. ශ්ලෝක ස්ව නිර්මාණ විය යුතුය.

04. තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01 කි.

05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

06. ජාතික මට්ටම දක්වාම පහත තේමා යටතේ මාතෘකා සැකසේ.

| | | | |
|---|---|---|---|
| i. | සංස්කෘත පඬිවරු | vi. | සංස්කෘත ග්‍රන්ථ |
| ii. | ආගමික උත්සව | vii. | ශ්‍රේෂ්ඨ රජවරු |
| iii. | දළදා - මිහිඳු - දුමිඳු ආගමනය | viii. | සංගායනා |
| iv. | ධර්මාශෝක මහාධිරාජයා | ix. | ශ්‍රී ලංකාද්වීපය |
| v. | පිරිවෙන් අධ්‍යාපනය | x. | සංස්කෘත පොතපත |

11 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | ශ්ලෝක වල අන්තර්ගතය | - | 10 |
| ii. | සංස්කෘත භාෂාව හැසිරවීම | - | 10 |
| iii. | නිර්මාණ කුසලතාව | - | 10 |
| iv. | මාතෘකාවට උචිතබව | - | 10 |
| v. | වෘත්තය රැකීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |

## (10) පාලි ගාථා රචනා තරගය:

මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෝෂ්ඨ අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. දෙනු ලබන මාතෘකාවකට අනුව තමන් කැමති වෘත්තයකින් එම මොහොතේදී ම පද්‍ය නිර්මාණය කිරීමට තරගකරුවන්ට සිදු වේ.

10 - 1 <u>අභිමතාර්ථ</u>

I. පාලි භාෂා නිපුණතාව ලබා ගන්නා අතරම ගාථා රචනය සඳහා නැඹුරු කිරීම.

II. ගාථා රචනයට අවශ්‍ය ශාස්ත්‍රීය මූලධර්ම ඉගෙනීමට හා විවිධ වෘත්ත හඳුනා ගැනීමට පෙළඹවීම.

10 - 2 <u>තරග කොන්දේසි</u>

01. තරගකරුවන් කැමති වෘත්තයකින් හෝ වෘත්ත කිහිපයකින් ගාථා 06 ක් රචනා කළ යුතුය.

02. එම මොහොතේ ලබාදෙන මාතෘකාවන්ගෙන් තෝරාගත් මාතෘකාවක් අනුව ගාථා නිර්මාණය කළ යුතුය.

03. ගාථා ස්ව නිර්මාණ විය යුතුය.

04. තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01 කි.

05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

06. ජාතික මට්ටම දක්වාම පහත තේමා යටතේ මාතෘකා සැකසේ.

| | | | |
|---|---|---|---|
| i. | ජාතික නායකයින් | vi. | ශ්‍රේෂ්ඨ රජවරු |
| ii. | ආගමික උත්සව | vii. | අටුවාචාරීන් |
| iii. | ආගමික ප්‍රබෝධයේ නිර්මාතෘවරු | viii. | මව්බිමේ අසිරිය |
| iv. | පිරිවෙන් අධ්‍යාපනය | ix. | දළදා වහන්සේ |
| v. | මහින්දාගමනය හා දුමින්දාගමනය | x. | පාලි පොතපත |

10 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | ගාථාවේ අන්තර්ගතය | - | 10 |
| ii. | පාලි භාෂාව හැසිරවීම | - | 10 |
| iii. | නිර්මාණ කුසලතාව | - | 10 |
| iv. | මාතෘකාවට උචිතබව | - | 10 |
| v. | විරිත රැකීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |



## (07) දෙමළ අත් අකුරු තරගය:

මෙම තරගය පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. දෙමළ අකුරින් ලබාදෙන ජේදයක් දෙමළ අකුරින් ලියා දැක්වීමට තරගකරුවන්ට සිදු වේ.

07 - 1 <u>අභිමතාර්ථ</u>

I. දෙමළ අක්ෂර සම්මත හැඩයෙන් හා පිරිපුන් බවින් ලිවීමටත් දෙමළ අකුරු භාවිතයටත් යොමු කිරීම.

II. සම්ප්‍රදායානුකූලව පද බෙදීමට හා නිවැරදිව දෙමළ ලේඛන සම්ප්‍රදායයන් හුරුවීමට පෙළඹවීම.

07 - 2 <u>තරග කොන්දේසි</u>

01. දෙමළ අකුරින් ලබාදෙන ජේදය නියමිත හැඩයෙන් ලිවිය යුතුය.

02. තරගකරුවන්ට පැය 01 ක කාලයක් හිමි වේ.

03. පද බෙදීම හා පැහැදිලිව අකුරු ලිවීම පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

04. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

07 - 3 <u>ලකුණු ලබාදීමේ ක්‍රමය</u>

| | | | |
|---|---|---|---|
| i. | අකුරුවල පිරිපුන් බව හා හැඩය | - | 20 |
| ii. | නිවැරදිව අකුරු ලිවීම | - | 10 |
| iii. | විරාම ලකුණු යෙදීම | - | 05 |
| iv. | පද වෙන් කර ලිවීම | - | 05 |
| v. | පැහැදිලිව හා පිරිසිදුව ලිවීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |

## (08) බෞද්ධ චිත්‍ර තරගය:

මෙම තරගය අංශ හතරම සඳහා පැවැත් වේ. ප්‍රාථමික, කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ තුන සඳහා පමණක් චිත්‍ර ශිල්ප කලා පිළිබඳ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීමට සිදු වේ.

08 - 1 අභිමතාර්ථ

I. ශ්‍රී ලාංකික බෞද්ධ චිත්‍ර කලා සම්ප්‍රදාය පිළිබඳ ප්‍රබුද්ධ ආකල්පයක් ඇති කිරීම හා චිත්‍ර කලාව පිළිබඳ කුසලතා වර්ධනය කිරීම

II. චිත්‍ර ශිල්ප කලා පිළිබඳ දැනුම ඇති කර ගැනීමට යොමු කිරීම හා තමන්ටම ආවේණික වූ චිත්‍ර සම්ප්‍රදායයක් ගොඩනගා ගැනීමට පෙළඹවීම.

08 - 2 තරග කොන්දේසි

01. 18x12 ප්‍රමාණයේ බෝඩ් එකක චිත්‍රය ඇඳිය යුතුය.
02. සමස්ත ලංකා තරග වටයේ දී පමණක් අදාළ බෝඩ් එක සැපයේ.
03. තමන්ට අවශ්‍ය පාට හෝ සායම් වර්ග තරගකරුවන් විසින් රැගෙන ආ යුතුය.
04. තමන්ට ම ආවේණික වූ සම්ප්‍රදායයක් ගොඩනගා ගැනීමට තරගකරුවන් උනන්දු විය යුතුය.
05. දෙනු ලබන මාතෘකා කිහිපයකින් එක් මාතෘකාවක් තෝරා ගැනීමට හා තමා කැමති මාධ්‍යයක් භාවිත කිරීමට තරගකරුවන්ට නිදහස ලැබේ.
06. සියලුම අංශ සඳහා පැය 3 ක කාලයක් හිමි වේ.
07. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

08 - 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| i. | වර්ණ සංකලනය | - | 20 |
| ii. | අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාව | - | 10 |
| iii. | නිර්මාණ ශක්තිය | - | 10 |
| iv. | සමස්ත නිමාව | - | 05 |
| v. | මාතෘකාවට අදාළ බව | - | 05 |
| | **මුළු ලකුණු** | - | **50** |
| | **ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු** | - | **50** |
| | **එකතුව** | - | **100** |



## (09) සිංහල පද්‍ය රචනා තරගය:

මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ දෙක සඳහා පමණක් පැවැත් වේ. දෙනු ලබන මාතෘකාවකට අනුව තමන් කැමති වෘත්තයකින් එම මෙහොතේදී ම පද්‍ය නිර්මාණය කිරීමට තරගකරුවන්ට සිදු වේ.

09 - 1 අභිමතාර්ථ

I. භාෂා නිපුණතාව ලබා ගන්නා අතරම පද්‍ය කරණය සඳහා නැඹුරු කිරීම.

II. පද්‍ය නිර්මාණයට අවශ්‍ය ශාස්ත්‍රීය මූලධර්ම ඉගෙනීමට හා රසාස්වාදනය සඳහා පෙළඹවීම.

09 - 2 තරග කොන්දේසි

01. තරගකරුවන් කැමති වෘත්තයකින් හෝ වෘත්ත කිහිපයකින් කවි 12 ක් වත් රචනා කළ යුතුය.
02. එම මොහොතේ ලබාදෙන මාතෘකාවන්ගෙන් තෝරාගත් මාතෘකාවක් අනුව පද්‍ය නිර්මාණය කළ යුතුය.
03. කවි ස්ව නිර්මාණ විය යුතුය.
04. තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01 කි.
05. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
06. ජාතික මට්ටම දක්වාම පහත තේමා යටතේ මාතෘකා සැකසේ.
   - i. ස්වභාව සෞන්දර්ය
   - ii. ආගමික හා ජාතික උත්සව
   - iii. ජාතික, ආගමික, සමාජීය හා කාලීන ප්‍රශ්න
   - iv. ශ්‍රී ලංකා පුණ්‍යභූමිය
   - v. බෞද්ධාගම පැමිණීම
   - vi. පිරිවෙන් අධ්‍යාපනය

09 - 3 ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| i. | කාව්‍ය අන්තර්ගතය | - | 10 |
| ii. | කාව්‍යමය භාෂාව | - | 10 |
| iii. | නිර්මාණ කුසලතාව | - | 10 |
| iv. | මාතෘකාවට උචිතබව | - | 10 |
| v. | විරිත රැකීම | - | 10 |
| | **මුළු ලකුණු** | - | **50** |